සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

9 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | 44 S I

නම: ..............................................

**නර්තනය**

කාලය පැය දෙකයි

- **සියලුම ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 10 තෙක් ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අදින්න.**

01) පහතරට හා සබරගමු සම්ප්‍රදායන්හි ගොඩ සරඹ හඳුන්වන නාමයන් පිළිවෙලින්,
1. අත්සරඹ හා ඉලංගම් සරඹ වේ  2. ඉලංගම් සරඹ හා දොඹින පද වේ
3. මණ්ඩි පද හා ඉලංගම් සරඹ වේ  4. ගොඩ සරඹ හා දොඹින පද වේ

02) සිංහරාජ වන්නම නර්තනය කරනු ලබන තාලරූපය වන්නේ,
1. මාත්‍රා 2 + 2 තනිතිත ය.  2. මාත්‍රා 3 + 3 තනිතිත ය.
3. මාත්‍රා 4 + 4 තනිතිත ය.  4. මාත්‍රා 2 + 3 දෙතිත ය.

03) ගැටබෙරයේ දකුණු ඇසින් වාදනය කරනු ලබන බෙර අක්ෂර වනුයේ,
1. ජිත්, නං ය.  2. තත්, නං ය.  3. තත්, තොං ය.  4. තත්,ජිත් ය.

04) 'දොංජි ජිගත' බෙර පදයට අනුව ගායනා කරනු ලබන කවි විශේෂයකි,
1. පන් නෙළීම  2. ගොයම්  3. සොකරි  4. කඩතුරා

05) තිසර සංදේශය ලියවී ඇති යුගය කුමක් ද?
1. අනුරාධපුර  2. කෝට්ටේ  3. පොළොන්නරු  4. ගම්පොළ

06) පහන් මඩුව ශාන්තිකර්මයේ පුද ලබන දෙවි කෙනෙකි,
1. වාහල දෙවි  2. දැඩිමුණ්ඩ දෙවි  3. දොළහ දෙවි  4. කොහොඹා දෙවි

07) කථක් නර්තනය උගන්වනු ලබන අධ්‍යාපන ආයතනයක් වේ,
1. ශාන්තිනිකේතනය  2. කේරළ කලා මණ්ඩලය
3. භාත්ඛණ්ඩේ විශ්ව විද්‍යාලය  4. කලා ක්ෂේත්‍රම්

08) දෙවොල්මඩු ශාන්තිකර්මය පැවැත්වීමේ අතීත අරමුණ වන්නේ,
1. සෞභාග්‍ය හා සශ්‍රීකත්වය උදාකර ගැනීමයි.  2. පඬුවස්දෙව් රජුට වැළඳුන දිවිදෝෂය දුරුකර ගැනීමයි.
3. සේරමාන රජුට ඇති වූ හිසරදය දුරුකර ගැනීමයි.  4. ස්වභාවික විපත් වලින් ආරක්ෂා වීමයි.

09) ස්වභාවිකත්වයෙන් මිදී අතිශයෝක්තියෙන් නිරූපණය කෙරෙන නාට්‍ය වර්ගයකි,
1. මුද්‍රා නාට්‍ය  2. ගීත නාට්‍ය  3. තාත්වික නාට්‍ය  4. ශෛලිගත නාට්‍ය

10) 'රන්වන් දුල් කරලින් පැසිලා' ගීතයේ පද රචකයා වන්නේ,
1. ආර්. මුත්තුසාමි මහතා ය.  2. බෙනඩික් ප්‍රනාන්දු මහතා ය.
3. ආනන්ද සමරකෝන් මහතා ය.  4. සූරිය ශංකර් මොල්ලිගොඩ මහතා ය.

- අංක 11 - 15 දක්වා ප්‍රශ්න වල හිස්තැනට සුදුසු වචනය වරහනින් තෝරා ලියන්න.
(ඩබ්.බී. මකුලොලුව / බටනළාව / කරුණ /සොකරි / විල්සන් ඔලබොඩුව)

11) ශෝක නමැති ස්ථායී භාවය මඟින් .............................. රසය නිරූපණය වේ.

12) දෙපානෝ ගීත නාට්‍යය .......................... මහතාගේ නිර්මාණයකි.

13) කථක් නර්තනයේ දී සුසිර වාද්‍ය භාණ්ඩයක් ලෙස ...................................... යොදා ගැනේ.

14) 'රංගලීල' ප්‍රසංගය ...................................... ගුරුතුමාගේ සුවිශේෂී මෙහෙවරකි.

15) 'ලාභක් විතර වී අච්චේ වනාලා..........' මෙය ...................................... කවියකි.

**● ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට පහත වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.**

| පේළිය | A තීරුව | B තීරුව | C තීරුව | D තීරුව |
|---|---|---|---|---|
| 1 | තම්මැට්ටම | දවුල | පහතරට බෙරය | ගැටබෙරය |
| 2 | සුරත්තට්ටුව | කැපුම් හම | ඉල්ලම් මුදු | හයිතට්ටුව |
| 3 | අලාරිප්පු | ආමද් | පරන් | ජතීශ්වරම් |
| 4 | කෝට්ටේ | ගම්පොළ | අනුරාධපුරය | පොළොන්නරුව |

16) ගැටබෙරයට අයත් කොටස් දැක්වෙනුයේ,
1. 1 පේළියේ AB තීරුවල ය
2. 2 පේළියේ AB තීරුවල ය
3. 3 පේළියේ BC තීරුවල ය
4. 4 පේළියේ BC තීරුවල ය

17) සැස්සේරුව හා පාලමොට්ටායි යන සෙල්ලිපි අයත් යුග දැක්වෙනුයේ,
1. 4 පේළියේ AB තීරුවල ය
2. 4 පේළියේ AC තීරුවල ය
3. 4 පේළියේ BC තීරුවල ය
4. 4 පේළියේ CD තීරුවල ය

18) පංචතූර්ය වාද්‍ය භාණ්ඩ වලට අයත් විතත භාණ්ඩයක් ඇතුළත් වන්නේ,
1. 1 පේළියේ A තීරුවේ ය
2. 1 පේළියේ B තීරුවේ ය
3. 1 පේළියේ C තීරුවේ ය
4. 1 පේළියේ D තීරුවේ ය

19) කථක් නර්තන අංග ඇතුළත් වරණය වන්නේ,
1. 3 පේළියේ AB තීරුව ය
2. 3 පේළියේ AC තීරුව ය
3. 3 පේළියේ BC තීරුව ය
4. 3 පේළියේ CD තීරුව ය

20) ''දොදොංත තකුදොං'' යන බෙරපදය වාදනය කළ හැකි වාද්‍ය භාණ්ඩය අයත් වන්නේ,
1. 1 පේළියේ A තීරුවට ය.
2. 1 පේළියේ B තීරුවට ය.
3. 1 පේළියේ C තීරුවට ය.
4. 1 පේළියේ D තීරුවට ය.

(ල. 1 x 20 =20)

## II කොටස

**● පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
**● පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**

01) තාලය මත ගායනය, වාදනය, නර්තනය රඳා පවතියි.
i. මාත්‍රා 3 + 3 තාල රූපයට අයත් බෙර පදයක් ප්‍රස්තාර කරන්න. (ල.03)
ii. ''කොතින් කොනට පන් උදුරා ගන්නේ'' මෙම කවිය අදාළ තාල රූපයට ප්‍රස්තාර කරන්න. (ල.03)
iii. සිංහරාජ වන්නමේ කස්තිරම සම්පූර්ණයෙන් ලියා දක්වන්න. (ල.04)

02) ගමට රටට සෙතක් ශාන්තියක් ලබා දීම ශාන්තිකර්මවලින් අපේක්ෂා කෙරේ.
i. පහන් මඩු, ශාන්තිකර්මයේ පුද ලබන දෙවිවරු තිදෙනෙක් නම් කරන්න. (ල.03)
ii. පහන්මඩු ශාන්තිකර්මය වර්තමානයේ පැවැත්වීමට හේතු 03 ක් නම් කරන්න. (ල.03)
iii. පහන්මඩු ශාන්තිකර්මයේ පුරාවෘත්ත කතාව කෙටියෙන් ලියන්න (ල.04)

03) කථක් නර්තනය තුළින් මෝගල් සංස්කෘතික ලක්ෂණ විද්‍යමාන වේ.

i. කථක් නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ 03 ක් නම් කරන්න. (ල.03)

ii. කථක් නර්තනයේ ප්‍රවර්ධනයට දායක වූ ශිල්පීන් තිදෙනෙක් නම් කරන්න. (ල.03)

iii. කථක් නර්තනය උගන්වනු ලබන අධ්‍යාපන ආයතනයක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ල.04)

04) සතර අභිනය උපයෝගී කරගනිමින් කතා පුවතක් ඉදිරිපත් කිරීම නාට්‍ය කලාවේ දී සිදුවේ.

i. ශෛලිගත නාට්‍ය සඳහා උදාහරණ තුනක් දක්වන්න. (ල.03)

ii. ශෛලිගත නාට්‍ය නිර්මාණකරුවන් තිදෙනෙක් නම් කරන්න. (ල.03)

iii. ගීත නාට්‍ය පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න. (ල.04)

05) පහත සඳහන් මාතෘකා අතරින් 02 ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. ගැටබෙරය

ii. ජන ගී

iii. විල්සන් ඔලබොඩුව

iv. කථක් සරානා (ල. 5 x 2 = 10)

(මුළු ලකුණු 50)